# ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ දර්ශකය




**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**
**සෝෂල් ඉන්ඩිකේටර්**

**මැයි 2022**

# හැඳින්වීම

2019 නොවැම්බර් ජනාධිපතිවරණ ජයග්‍රහණයෙන් පසු ගෝඨාභය රාජපක්ෂ පාලනය මගින් රටට පුළුල් පරාසයක ජයග්‍රහණයන් අත්පත් කර දෙන බවට පොරොන්දු විය. ඒ අතරින් ප්‍රධාන වශයෙන් ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම මෙන්ම දූෂණයට එරෙහිව සටන් කිරීම, මනා විනයගරුක දේශපාලන පරිසරයක් සහතික කරන ඵලදායී පාලන යාන්ත්‍රණයක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරන පුළුල් සහතික මාලාවක් ඉදිරිපත් කරන ලදී.

ජාතියට නායකත්වය දීමට ශක්තිමත් මිනිසෙකු සමග පරිපූර්ණ කණ්ඩායමක් සිටින බව වත්මන් ජනාධිපතිවරයා සහ ඔහුගේ රජය ඔවුන්ගේ මැතිවරණ කොට්ඨාශයට පමණක් නොව, සමස්තයක් වශයෙන් රටේ සියලුම පුරවැසියන්ට ප්‍රකාශ කරන ලදී. එමෙන්ම දශක තුනකට ආසන්න සිවිල් යුද්ධය ජයග්‍රහණය කිරීමේ ඔවුන්ගේ අතීත වාර්තාව සලකා බැලීමේදී කොරෝනා වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස මුහුණ දෙන අභියෝග මෙන්ම වර්ධනය වෙමින් පවතින ආර්ථික අර්බුදය ආයාසයකින් තොරව අභිබවා යා හැකි බව ද සහතික කළේය.

ශ්‍රේෂ්ඨ පොරොන්දු ලබා දී තිබුනත් විශාල අභියෝග යන් පැමිණෙද්දී නොසැලකිලිමත්කමින් සහ දුර්වල කළමනාකාරීත්වයකින් එයට ප්‍රතිචාර දක්වන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මූල්‍ය සහය ලබාගැනීමට විරුද්ධවීම, බදු කපා හැරීම, හීනවෙමින් පවතින විදේශ මුදල් සංචිත, ආනයනයන් තහනම සහ සම්පූර්ණයෙන් රසායනික පොහොර තහනම් කිරීම යන හේතූන් දිවයින පුරා විදුලිය, බලශක්තිය, ආහාර සහ ඖෂධ වැනි මූලික අත්‍යාවශ්‍ය ද්‍රව්‍යවල හිඟයට බලපෑවේය. ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයකට අත්‍යාවශ්‍ය භාණ්ඩ හිඟය හමුවේ මූලික භාණ්ඩ ලබා ගැනීම සඳහා පැය ගණනක් දිගු පෝලිම්වල සිටීමට සිදුව ඇති අතර, ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට අපහසු වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස රට තුළ පවතින වර්තමාන දේශපාලන අර්බුදයට මගපෙන්වූ රාජපක්ෂ ආණ්ඩුව ඉල්ලා අස්විය යුතුය යන ඉල්ලීමත් සමග ප්‍රචණ්ඩකාරී නොවන අවිහිංසාවාදී විරෝධතාවන් දිවයින පුරා ව්‍යාප්ත විය.

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකයේ දෙවැනි අදියර යටතේ මෙම සමීක්ෂණ වාර්තාව සකසා ඇත. මෙම සමීක්ෂණය මගින් පවතින අර්බුදයේ තත්ත්වය මහජන අත්දැකීම් ඇසුරින් බැලීමත්, ඊට බලපෑ හේතු මෙන්ම ඒවාට ලබාදෙන විසඳුම් පිළිබඳ තක්සේරු කළ විද්‍යාත්මක මත විමසීමක් සිදු කරන ලදී. මෙම අධ්‍යයනය දැනට පවතින දේශපාලන විවාදය වර්ධනය කිරීම පමණක් නොව, ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ශාස්ත්‍රඥයන්ට සහ විවිධ දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන්ට අවශ්‍යය දත්තයන් ද සපයනු ලැබේ. ඒ අනුව මෙම අධ්‍යයනය, සමාජයේ විවිධ සමාජ කණ්ඩායම් අතර පවතින විවිධ ගතිකයන් පිළිබඳ වඩාත් හොඳ අවබෝධයක් ලබා ගැනීමටත් වඩාත් තිරසාරමය ප්‍රතිපත්තීන්හි මැදිහත්වීමක් වෙනුවෙන් උපදේශනයක් සැපයීමටත් උපකාරී වේ.

මෙම පර්යේෂණ අධ්‍යයනය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසින් සිදු කරන ලදී. එහි ආරම්භයේ සිටම (1999) ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ සමාජ-දේශපාලනය වැනි පුළුල් පරාසයක ගැටළු කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම අධ්‍යයනයට අදාළ සමීක්ෂණ පර්යේෂණ කණ්ඩායම, ආචාර්ය ප්‍රදීප් පීරිස්, සකීනා මොයිනුඩීන්, එම්. ක්‍රිෂ්ණමූර්ති සහ ඉෂාර ජයරත්න යන අයගෙ න් සමන්විත විය. මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීමට දැක්වූ සහයෝගයට ආචාර්ය පයික්‍යාසෝති සරවනමුත්තු මහතාට අපි අවංකවම ස්තූතිවන්ත වෙමු. එසේම, කෞෂිණී දම්මලගේ දැක්වූ පර්යේෂණ සහය සහ සහයෝගය ද අපි අගය කරමු. මෙහි කවරයේ ඡායාරූප මාත්‍රම්හි කතෘ (Maatram - https://maatram.org/) සෙල්වරාජා රාජසේගර් සහ නස්ලි අහමඩ්ගේ අනුග්‍රහයෙනි.

# ක්‍රමවේදය

ප්‍රජාතාන්ත්‍රීය ආණ්ඩුකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ දර්ශකයේ දෙවැනි අදියරය අර්ධ ව්‍යුහගත ප්‍රශ්ණාවලියක් හරහා ප්‍රධාන වාර්ගික කණ්ඩායම් හතරෙහි (සිංහල, දෙමළ, උඩරට දෙමළ, මුස්ලිම්) ප්‍රතිචාරකයින් 1200 ක් නියැදියක් වශයෙන් යොදාගෙන සිදු කරන ලදී. දිවයිනේ දිස්ත්‍රික්ක 25 පුරාවට ප්‍රතිචාරදැක්වුවන්ගේ සහ සමීක්ෂකයන්ගේ පළමු භාෂාවෙන් මුහුණට මුහුණලා සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

මෙම නියැදිය සියලු දිස්ත්‍රික්කයන්හි ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශයන්හි වෙසෙන ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර  විහිදී ඇත. නියැදි ස්ථාන තේරීම සඳහා බහු-අදියර අහඹු ස්ථර නියැදි තාක්ෂණය භාවිතා කරන ලද අතර, නියැදි ස්ථාන තුළ හිමබෝල නියැදී තාක්ෂණය භාවිතයෙන් ප්‍රතිචාරකයන් තෝරා ගන්නා ලදී. මෙහිදී ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කිරීමට පෙර ක්ෂේත්‍ර සමීක්ෂකයන්ට පර්යේෂණ මෙවලම්  සහ ක්ෂේත්‍ර ශිල්පීය ක්‍රම පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දුන් අතර ක්ෂේත්‍ර සමීක්ෂකවරුන්ට ඔවුන්ගේ පළමු භාෂාවෙන් ක්ෂේත්‍ර දැනුවත් කිරීම් සිදු කළේය.

ජාතික වශයෙන් අදහස් විමසීම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2022 අප්‍රේල් 19 සිට 25 දක්වා පවත්වන ලදී. ක්ෂේත්‍ර දත්ත එකතු කිරීමේදී ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරේ ස්ත්‍රී සහ පුරුෂ යන දෙඅංශයෙන්ම නියෝජනය වන පරිදි ක්ෂේත්‍ර සමීක්ෂකයන් 76 දෙනෙක් මෙම අධ්‍යයනයට සහභාගී වූහ. එකතු කරන ලද දත්තවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා සම්පූර්ණ නියැදියෙන් 10% කට වඩා වැඩි ප්‍රමාණයක් තත්ත්ව පරීක්ෂාවට ලක් කරන ලදී.  මෙහිදී ජනගහනයේ සැබෑ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත.  සමාජ විද්‍යාව සඳහා සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත කට්ටලය විශ්ලේෂණය කරන ලදී.

# විධායක සාරාංශය

## මහජන අත්දැකීම්

ජාතික වශයෙන් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 88% ක් ප්‍රකාශ කරන්නේ ඔවුන්ට හෝ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයෙකුට ගෑස්, ඉන්ධන, කිරිපිටි, පොහොර වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම සඳහා පසුගිය මාසයක කාලය තුළ පෝලිම්වල රැඳී සිටීමට සිදු වූ බවයි. මෙම තත්ත්වය නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ දෙකෙහිම මෙන්ම සියලු ජනවාර්ගික ප්‍රජාවන් තුළ ද දක්නට ලැබේ.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අතිමහත් බහුතරයක් (90%) ප්‍රකාශ කරන්නේ ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස තම ආදායමට හෝ සමීපතම පවුලේ සාමාජිකයෙකුගේ ආදායමට බලපෑම් එල්ල වී ඇති බවයි.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් (48.5%) ප්‍රකාශ කරන්නේ ඔවුන් හෝ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයෙකු වත්මන් ආර්ථික අර්බුදයට වගකිව යුතුත්තන්ට එරෙහිව සංවිධානය කරන ලද විරෝධතාවන්ට සහභාගී වූ බවයි.

## වගවීම පිළිබඳ දැක්ම

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (62%) ප්‍රකාශ කරන්නේ ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවේ දුර්වල ආර්ථික කළමනාකරණය, මෙරට උත්ගත වී ඇති වත්මන් අර්බුදකාරී තත්ත්වයට වගකිව යුතු බවයි.

ජනවාර්ගික දෘෂ්ටිකෝණයකින් බලන විට, රටේ පවතින අර්බුදකාරී තත්ත්වයට වත්මන් ආණ්ඩුවේ දුර්වල ආර්ථික කළමනාකරණය වගකිව යුතු බව සියලු වාර්ගික ප්‍රජාවන්හි බහුතරය ප්‍රකාශ කරයි.

## යථා තත්ත්වයට පැමිණීම පිළිබඳ විශ්වාසය

මහජනතාවට රටේ අනාගතය පිළිබඳව ඇත්තේ සැකසහිත දැක්මකි. මෙහිදී ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 60% කට ආසන්න ප්‍රමාණයක් රට යථා තත්ත්වයට පත් කිරීමට බොහෝ කාලයක් ගතවනු ඇතැයි ප්‍රකාශ කිරීමෙන් මේ බව තවදුරටත් පැහැදිලි වේ. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් හතරෙන් එකක් ප්‍රකාශ කළේ රට සාමාන්‍ය තත්ත්වයට පත්වන්නේ කවදාදැයි තමන් නොදන්නා බවයි.

## යෝජිත ඉල්ලීම් පිළිබඳ දැක්ම

සැලකිය යුතු බහුතරයකගේ (87.3%) මතය වී ඇත්තේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ඉල්ලා අස්විය යුතු බවයි.

ප්‍රතිචාරකයන්ගෙන් 90% කට ආසන්න පිරිසකගේ මතය වී ඇත්තේ අගමැති මහින්ද රාජපක්ෂ ඉල්ලා අස්විය යුතු බවයි.

ප්‍රතිචාරකයන් දස දෙනෙකුගෙන් නව දෙනෙකුම විශ්වාස කරන්නේ රාජපක්ෂ පවුල ශ්‍රී ලංකා දේශපාලනයෙන් ඉවත් විය යුතු බවයි. වාර්ගික ,වයස් කාණ්ඩ සහ ප්‍රාදේශීය යන කිසිදු භේදයකින් තොරව සැලකිය යුතු ප්‍රතිචාරකයන් පිරිසක් මෙම මතය හා එකඟ වේ.

රට පවතින අර්බුදකාරී තත්ත්වයෙන් ගොඩ එනතුරු පාර්ලිමේන්තුවේ සියලුම පක්ෂවලින් සමන්විත අන්තර්වාර ආණ්ඩුවක් ස්ථාපිත කළ යුතු බව 74% කට ආසන්න පිරිසකගේ අදහස වී ඇති අතර ප්‍රතිචාරකයන්ගෙන් පහෙන් එකකට ආසන්න පිරිසක් ඊට විරුද්ධ වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනාම ඉල්ලා අස්විය යුතුය යන ඉල්ලීමට ප්‍රතිචාරකයන්ගෙන් 60% කට ආසන්න ප්‍රමාණයක් එකඟ වන අතර, 34% කට ආසන්න පිරිසක් එයට විරුද්ධ වෙති. එසේම රටේ තත්ත්වය පිළිබඳ අවිනිශ්චිත යැයි ප්‍රකාශ කරන පිරිසෙන් වැඩි වශයෙන් සිටින්නේ මුස්ලිම් ප්‍රජාව ය.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු බහුතරයක් (74%) ප්‍රකාශ කරන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු බවයි.

ප්‍රතිචාරකයෝ 74%කට ආසන්න පිරිසක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය අහෝසි කළ යුතු බවටත්, 19 වැනි සංශෝධනය වැනි සංශෝධනයක් ගෙන ආ යුතු බවටත් එකඟ වෙති.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු බහුතරයකගේ අදහස වී ඇත්තේ පවතින අර්බුදයෙන් ගොඩ එනතුරු විද්වත් මණ්ඩලයක් මගින් රට පාලනය කළ යුතු බවයි.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අතිමහත් බහුතරයකගේ (96.2%) මතය වී ඇත්තේ දේශපාලනඥයන් විගණනය කළ යුතු අතර ඔවුන්ගේ විගණනය කළ නොහැකි සියලු ධනය රජය විසින් රාජසන්තක කළ යුතු බවයි. වාර්ගික, වයස් කාණ්ඩ සහ ප්‍රාදේශීය යන භේදයකින් තොරව සැලකිය යුතු ප්‍රතිචාරකයන් පිරිසක් මෙම මතය හා එකඟ වේ.

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දෘඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනය: නො. 6/5, ලේයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2081384/+94 11 2081385/ +94 11 2081386
ෆැක්ස්: +94 (11) 2081388
වෙබ්: www.cpalanka.org
විද්‍යුත් තැපැල : info@cpalanka.org

Making Social Research Count

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවති රික්තයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනය: 6/1බී 1/1 ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2584050
වෙබ් : www.cpalanka.org/survey-research/
විද්‍යුත් තැපැල: krishna@cpasocialindicator.org